# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,123 - 2019 මැයි මස 10 වැනි සිකුරාදා - 2019.05.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1282 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1284 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1285 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1286 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2019 මැයි මස 31 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 මැයි මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - බලංගොඩ

### අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

බලංගොඩ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ 2019.05.25 වැනි දින පෙ.ව. 9.00 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම වෙන්දේසි කරනු ලබන කිසියම් භාණ්ඩයක් පිළිබඳව අයිතිවාසිකම් කියන්නකු වේ නම් ඒ පිළිබඳ වෙන්දේසිය පවත්වනු ලබන දින පෙ.ව. 8.30 ට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කල යුතුය.

වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

වෙන්දේසියේ දී මිලදී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේදී මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර සියලුම ගෙවීම් මුදල්වලින් පමණක් කල යුතුය.

අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හිදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව තිබේ. වෙන්දේසියේ භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන අය තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කල යුතු ය.

ඩී. එම්. ජේ. දිසානායක,
දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
බලංගොඩ.

2019 අප්‍රේල් මස 22 වැනි දින,
බලංගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

වෙන්දේසිය සඳහා නියමිතව ඇති භාණ්ඩ ලැයිස්තුව

| අනු. අංකය | නඩු අංකය | විස්තරය |
|---|---|---|
| (1) | 42833 | LE 5997 දරන ලොරි රථය (කැබලි කිරීම සඳහා) |
| (2) | 64933 | YT 4926 දරන ත්‍රී රෝද රථය |
| (3) | 62305 | LC 3818 දරන ලොරි රථය (කැබලි කිරීම සඳහා) |
| (4) | 41039 | PR 9938 දරන ලොරි රථය (කැබලි කිරීම සඳහා) |
| (5) | අංක රහිත | අත් ට්‍රැක්ටර් එන්ජිම |
| (6) | අංක රහිත | අත් ට්‍රැක්ටර් එන්ජිම |
| (7) | අංක රහිත | අත් ට්‍රැක්ටර් එන්ජිම |
| (8) | අංක රහිත | අත් ට්‍රැක්ටර් එන්ජිම |
| (9) | අංක රහිත | අත් ට්‍රැක්ටර් එන්ජිම |
| (10) | B/7730 | MV5094 දරන යතුරු පැදිය (කැබලි කිරීම සඳහා) |
| (11) | 64811 | අත් ට්‍රැක්ටරය |
| (12) | 51972 | අත් ට්‍රැක්ටරය |
| (13) | 50966 | TZ 6578 දරන යතුරු පැදිය |
| (14) | 39111 | හිටාචි වර්ගයේ ස්කැවේටර් 01 |
| (15) | 60423 | LF 4262 දරන සුබාරු ලොරි රථය (කැබලි කිරීම සඳහා) |
| (16) | අංක රහිත | JW3141 දරන ත්‍රීවිල් රථය |
| (17) | AR 838/18 | කුලුගෙඩි 1 |
| (18) | AR 934/18 | ඇඳුම් උදළු 01, ජංගම දුරකථනය |
| (19) | AR 1268/18 | අඟල් 24BG එල්සීඩී වර්ණ රූපවාහිනිය<br>අඟල් 01 ප්‍රමාණයේ වතුර මෝටරය<br>SL11 J 13280 දරන සිංගර් DVD යන්ත්‍රය<br>අඟල් 01 වතුර මෝටරය<br>ආපිඩැක් වර්ගයේ අඟල් 2 වතුර මෝටරය |
| (20) | AR 1421/18 | LG වර්ගයේ අඟල් 22 වර්ණ රූපවාහිනිය<br>වතුර මෝටර 01<br>වතුර මෝටර 01<br>වතුර මෝටර 01 |
| (21) | AR 271/19 | එයා කම්ප්‍රෙෂරය, PVC අඟල් 1/2 කහපාට අඩි 33 හෝස් බටය අඩි 04 දිග ප්ලග් ටොප් එක සහිත වයරය, ප්ලග් ටොප් එක සහිත අඩි 54 දිග ඩබල් වයරය.<br>යකඩ බාල්දි 02, ගැරුම් වට්ටිය |
| (22) | AR 162/19 | උදැල්ල, වේවැල් කූඩය |
| (23) | AR 163/19 | උදැල්ල, බාල්දිය |
| (24) | AR 165/19 | උදැල්ල, කැස්ට්න් කුර |
| (25) | 70059 | ගෑස් සිලින්ඩර්<br>රෙගියුලේටරය සහිත ගෑස් ලිප |
| (26) | 71859 | රෙගියුලේටරය සහිත ගෑස් ලිප, ලිට්රෝ වර්ගයේ ගෑස් සිලින්ඩරය. |

05-167

## දැන්වීමයි

සම්මන්තුර මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර රාජසන්තක කරන ලද (වැලි හා පස්) ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - 2019

01. සම්මන්තුර මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද පහත සඳහන් නඩු භාණ්ඩ (වැලි හා පස්) 2019.05.17 වැනි දින ප. ව. 2.00 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට කලින් වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂාකර බැලිය හැකි වේ.

03. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතු වේ.

04. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර සියලුම ගෙවීම් මුදල්වලින් පමණක් කළ යුතු ය.

05. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කළ යුතු ය.

| *වෙන්දේසියට නියමිත භාණ්ඩ* | *ප්‍රමාණය* |
|---|---|
| 01. වැලි | කියුබ් 100 |
| 02. පස් | කියුබ් 60 |

එම්. අයි. එම්. රිස්වි,
මහෙස්ත්‍රාත්.

මහෙස්ත්‍රාත් අධිකරණය,
සම්මන්තුරේ.

05-412/1

---

## සංශෝධනයයි

මහෙස්ත්‍රාත් අධිකරණය - සම්මන්තුරය

2019.04.12 වැනි දින පළ වූ අංක 2119 දරන *ගැසට් පත්‍රයේ* අංක 04-757 නිවේදනය හා සම්බන්ධයි.

සම්මන්තුරය ප්‍රදේශයේ ඇති වූ නොසන්සුන් තත්ත්වය යටතේ 2019.04.28 වැනි දින පැවැත්වීමට නියමිත ව තිබූ නඩු භාණ්ඩ වෙන්දේසිය නොපැවැත්වූ බැවින් එම නඩු භාණ්ඩ වෙන්දේසිය 2019.05.25 වැනි දින පවත්වන බවත් නිවේදනය කරනු ලැබේ.

එම්. අයි. එම්. රිස්වි,
මහෙස්ත්‍රාත්.

2019 මැයි මස 02 වැනි දින,
මහෙස්ත්‍රාත් අධිකරණය,
සම්මන්තුරේ.

05-412/2

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2019/2020 වර්ෂය සඳහා මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම

01. 2019 ජූලි මස 01 වැනි දින සිට 2020 ජූනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසිය හා සෑම සුරාබදු බලපත්‍රයක් ම සඳහා අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණය යටත් පිරිසෙන් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතුයි.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ "අංක 13 දරන පම්බල රා තැබෑරුම" සඳහා ටෙන්ඩර් පත්‍රය යනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි රා තැබෑරුමෙහි නම සහ අංකය සඳහන් කොට 2019 මැයි මස 27 වැනි දින පෙ. ව. 10.30 ට පෙර මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුයි.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

05. 2019 මැයි මස 27 වැනි දින පෙ. ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු යි.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2019.06.18 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අදාළ විය යුතු ය.

මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

ඒ. එම්. සී. එම්. ප්‍රේමසූරිය,
ප්‍රාදේශීය ලේකම්,
මාදම්පේ.

2019 මැයි මස 02 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මාදම්පේ.

*උපලේඛනය*

| *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|---|---|
| උතුරු පිටිගල් කෝරළය | පම්බල | පෙ. ව. 11.00<br>ප. ව. 5.00 | ප. ව. 2.00<br>ප.ව. 8.00 | 13 | 2019.05.27<br>පෙ. ව. 10.30 | 1,000.00 |

05-347

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2019 අප්‍රේල් මස 10 වැනි දින සංස්ථාගත කරන ලදී

සමාගමේ නම : අල්ට්‍රියස්ට් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 00210953
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : නො. 108/3 1/1 ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

05-110

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2019 අප්‍රේල් මස 01 වැනි දින සංස්ථාගත කරන ලදී

සමාගමේ නම : බටදොල සිනමන් එස්ටේට් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 00210604
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : නො. 108/3 1/1 ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

05-111

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වන වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී

සමාගමේ නම : ග්ලෝබල් තර්ඩ් අයි (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 00211111
ලියාපදිංචි ලිපිනය : 102/C /10, මුතුලන්ද වත්ත, කටියාල, දෙමන් හන්දිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච් ටී පී බිස්නස් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්.

05-149

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වන වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී

සමාගමේ නම : ඊනර්ත් ලංකා (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 00211242
ලියාපදිංචි ලිපිනය : 298 - 4/1, ආර් ඒ ද මැල් මාවත, කොළඹ 03
ඉදිරිපත් කිරීම : අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච් ටී පී. බිස්නස් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්.

05-150

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් පහත සඳහන් දිනයන්හි දී සංස්ථාගත කරන ලදී.

| *සමාගමේ නම* | *පීවී අංකය* | *සංස්ථාගත කළ දිනය* | *ලියාපදිංචි ලිපිනය* |
|---|---|---|---|
| බී පී ඇන්ඩ් ක්‍රෙයිඩල් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 00209325 | 2019.02.27 | අංක 62 -10/1, කොටුබැම්ම පාර, කොටුබැම්ම හොරයිසන්, ඇතුල් කෝට්ටේ. |
| බෙකෝ (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 00209399 | 2019.03.02 | අංක 24/2, අන්ගම්පිටිය පාර, ඇතුල් කෝට්ටේ, කෝට්ටේ. |

සී එල් සී සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

05-103

### සංශෝධනයයි

2019.03.22 වැනි දින පළ කරන ලද අංක 2116 දරන ගැසට් පත්‍රයේ 03-1094 නිවේදනය පහත පරිදි සංශෝධනය විය යුතු යි.

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

නම : කල්කුඩා ප්‍රොපර්ටි ගෲප් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 00209229
සංස්ථාගත කළ දිනය : 2019.02.25
ලියාපදිංචි ලිපිනය : අංක 34, ගෝල් ෆේස් කෝට් 02, කොළඹ 03.

අධ්‍යක්ෂ.

05-276

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බැව් මින් දන්වමු.

සමාගමේ නම : පී බී එල්. ඉන්වෙස්ට්මන්ට්ස් (පී. වී. ටී.) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 00211002
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : 04 වැනි මහල, හියුජේ කෝට් අංක 32, සර් මොහමඩ් මාකන් මාකර් මාවත, කොළඹ 03.
ලියාපදිංචි කළ දිනය : 2019.04.12

සමාගම් ලේකම්.

05-327

## වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

එස්. එම්. එල්. අයි. සමරකෝන් සහ එස්. එම්. විමලචන්ද්‍ර.
ගිණුම් අංක : 0225 5000 1210.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර, 2019.01.31 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් අනූ දෙලක්ෂ අනූ දහස් අටසිය හැටයි ශත තිස් පහක (රු. 9,290,860.35) මුදල ද, 2018 දෙසැම්බර් මස 20 වැනි දින සිට අයවියයුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් එක් ලක්ෂ දහ තුන් දහස් අටසිය තිස් හතරයි ශත හැට අටක (රු. 5,113,834.68) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම දෙකයි පහක් (16.25%) හා තවත් රුපියල් දහහත් ලක්ෂ හැට හය දහස් දෙසීයක (රු. 1,766,200) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) හා තවත් රුපියල් විසි ලක්ෂයක (2,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.03.22 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.03.18 වැනි දින ''දිවයින'', සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2019.06.07 වැනි දින පෙ. ව. 11.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, අටකලන් කෝරළේ, කඳවෙල් පත්තුවේ, වැලිගේපොල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ ඇල්මල්පේ 220A දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පිටවෙල ග්‍රාමයේ පිහිටි "අස්වැද්දුම්වෙල" යයි කියනු ලබන බලයලත් මානක තැන එම්. එම්. ඩී. එස්. ශාන්ත යන අය විසින් සාදන ලද 2015 ජූනි මස 12 දාතම හා අංක 6345 දරන පිඹුරේ නිරූපිත සීමා නීර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 187 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : FVP 682 දරන පිඹුරේ ලොට් 183, නැගෙනහිරට : FVP 682 දරන පිඹුරේ ලොට් 186 සහ මෙම ඉඩමේ කොටසක්, දකුණට : පාර සඳහා වෙන් කිරීම් සහ බස්නාහිරට : FVP 682 දරන පිඹුරේ ලොට් 183 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් අටක් (A: 0, R: 1, P: 38) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 6345 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව T 14/102 යටතේ රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05-186

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි.

එන්. එච්. එන්. එස් ද සිල්වා.
ගිණුම් අංක : 1012 5930 8818.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.02.28 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හැට හතර ලක්ෂ තිස් හත් දහස් අටසිය හැත්තෑ හයයි ශත අනූවක (රු. 6,437,876.90) මුදලද, 2019 ජනවාරි මස 10 වැනි දින සිට අයවියයුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැට දෙලක්ෂ අසූ දෙදහස් එකසියඅසූ හතරයි ශත විසි හතරක (රු. 6,282,184.24) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහහතරයි දශම පහක් (14.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.04.12 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.04.02 වැනි දින ''දිවයින'', සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2019.05.28 වැනි දින පෙ. ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ. පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ ශාන්තාලෝකගම ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ඔරුවල පිහිටි 5 වන පටුමග වරිපනම් අංක 39 දරන "වනපොතු මූකලාන, ඔරුවල එස්ටේට් දෙනගහදෙණිය සහ මහකැලේමූකලාන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. එන්. වෙදගේ යන අය විසින් සාදන ලද 2018 පෙබරවාරි මස 26 දාතම හා අංක 1108 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 2535 දරන පිඹුරේ ලොට් 253, නැගෙනහිරට : අංක 2535 දරන පිඹුරේ ලොට් 298 (5 වන පටුමග), දකුණට : අංක 2535 දරන පිඹුරේ ලොට් 257 සහ බස්නාහිරට : අංක 2535 දරන පිඹුරේ ලොට් 255 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතක් (A:0, R:0, P:7) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 1108 දරන පිඹුරට අනුව ය.

එකී ලොට් A අංක 2535 දරන පිඹුරේ ලොට් 256හි නැවත මිනුමක් වන අතර පහතින් මැනවින් විස්තර කොට ඇත.

එකී ඔරුවල පිහිටි "වනපොතු මූකලාන, ඔරුවල එස්ටේට් දෙනගහදෙණිය සහ මහකැලේමූකලාන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. පී. ආර්. පතිරාජ යන අය විසින් සාදන ලද 1999 අගෝස්තු 22 දාතම හා අංක 2535 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 256 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 253, නැගෙනහිරට : ලොට් 298, දකුණට : ලොට් 257 සහ බස්නාහිරට : ලොට් 255 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතක් (A:0, R:0, P:7) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක 2535 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව B 1366/54 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අංක 2535 දරන පිඹුරේ නිරූපිත ලොට් 298, 391B, 297, 233 සහ 232 දිගේ හා ඒ මතින් යටින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05-170

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

(1) ණය යොමු අංකය : 80957402, 80967319, 80976381

බිබිල අම්පාර පාර, අංක 116 හි සැෆයාර් පැෂන් (පුද්ගලික) සමාගමට (බිබිල, අම්පාර පාර, අංක 116 හි පදිංචි දිසානායක මුදියන්සේලාගේ ඉන්දික තුසිත් ප්‍රියන්ත මහතා සහ රත්නායක මුදියන්සේලාගේ තිසේරා දමයන්ති ගුණසේකර මහත්මිය අධ්‍යක්ෂවරු වෙති) අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2019 අප්‍රේල්

මස 12 දිනැති අංක 2091 දරන ගැසට් පත්‍රයේ හා 2019 අප්‍රේල් 01 වැනි සඳුද දින ''ඩේලිනිව්ස්'' ''දිනමිණ'' හා ''තිනකරන්'' යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේදී ම 2019 මැයි මස 29 වැනි බදාදා දින පෙ. ව. 10.00 ට කොළොන්නාව, විහාර මාවත, අංක 182/3, (50/3) හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### උපලේඛනය

1. ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, වැගම්පත්තු කෝරළේ, බිබිලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා කොට්ඨාසයේ, බිබිලේ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බිබිලේ ග්‍රාමයේ පිහිටි "බණ්ඩාරවත්ත හෙවත් බිබිලේවලව්වේවත්ත" නමැති ඉඩමට එහි ඇති ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු ආර්. එම්. එස්. බණ්ඩාර විසින් සාදන ලද 2007 මාර්තු මස 09 දිනැති Mo-005 දරන පිඹුරෙහි ලොට් 5 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 5 උතුරට : පාර (මහා මාර්ගය) ද, නැගෙනහිරට : ලොට් 4 (ප්‍රවේශ මාර්ගය) ද, දකුණට : ලොට් 4 (ප්‍රවේශ මාර්ගය) ද, බස්නාහිරට : ලොට් 6 ද මායිම්ව එකී අංක Mo-005 දරන පිඹුරට අනුව පර්චස් විසි පහයි දශම පහක (අ. 0, රූ. 0, පර්. 25.5) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 38/106 යටතේ ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. ඒ. ඒ. ජේ. වීරක්කොඩි,
කළමනාකාරු.

2019 අප්‍රේල් මස 22 වැනි දින,
ලංකා බැංකුව, බිබිල.
05-180

---

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංකය : 82542028

කොළඹ 04, වජිර පාර, අංක 12/14ඒ 1/1 හි පදිංචි වගවත් ආරච්චිගේ අසංක ප්‍රේමචන්ද්‍ර මහතාට අයත් උකස් කරන ලද දේපල විකිණීම.

ලංකා බැංකු ආඥපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2019.03.29 දිනැති අංක 2117 දරන ගැසට් පත්‍රයේ හා 2019 මාර්තු 18 වැනි සඳුද දින ''ඩේලිනිව්ස්'' ''දිනමිණ'' හා ''තිනකරන්'' යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අය විය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේදී ම 2019.05.27 වැනි දින ප. ව. 1.30 ට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ, වාද්දු වස්කඩු දෙබැද්දේ, කළුතර ප්‍රාදේශීය සභා සීමාවේ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 711/B දරන පනාපිටිය උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පනාපිටිය සහ වත්තේගොඩ පිහිටි හොරණ පාරේ වරිපනම් අංක 848/27 දරන "මගුරුමුල්ල කැලේ සහ මගුරුමුල්ල අස්වැද්දුම, මුල්ලේවත්ත හෙවත් ගොඩැල්ලවත්ත සහ මගුරුමුල්ල වත්ත" හි යාබද ලොට් 6 සහ 5 නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. පී.ද එස්. තාබෘෘ විසින් සාදන ලද 2006 අප්‍රේල් 02 දිනැති අංක 2169 දරන පිඹුරෙහි ලොට් A 2 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් A2 උතුරට : ලොට් A1 එහෙත් ලියාපදිංචි වී ඇති ආකාරයට ලොට් A1 ද, නැගෙනහිරට : අඩි 20 පළල පාරට වෙන් කළ කොටස ද, දකුණට : ලොට් 7 හා ලොට් B ද, බස්නාහිරට: විල්බර්ට් සේනාරත්නගේ ඉඩම ද මායිම්ව එකී අංක 2169 දරන පිඹුරට අනුව පර්චස් විස්සයි දශම පහයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 20.50) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති පස, ගහකොළ, වගාවන් සහ ගොඩනැගිලි ද සමග වේ. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 122/58හි ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

එකී පනාපිටිය පිහිටි"මගුරුමුල්ල කැලේ සහ මගුරුමුල්ල අස්වැද්දුම" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් සාදන ලද 1968 ඔක්තෝබර් මස 21 දිනැති අංක 1370 දරන පිඹුරෙහි ලොට් A (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් A උතුරට : P. W. D. පාර ද, නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටස ද, දකුණට : වෛද්‍ය කුලසිංහට අයිති ඉහළවෙල ද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් 1-5, 8, 9, 18, 19, 28-30, 34 සහ ලොට් B, C, D හා E ද මායිම්ව එකී අංක 1370 දරන පිඹුරට අනුව රූඩ් එකයි පර්චස් තිස්හයක (අ. 0, රූ. 1, පර්. 36) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 16/129 හි ලියාපදිංචි කර ඇත.

එකී පනාපිටියෙහි පිහිටි"මගුරුමුල්ල කැලේ සහ මගුරුමුල්ල අස්වැද්දුම" නමැති ඉඩමේ අංක 1370 දරන එකී පිඹුරෙහි ලොට් B (පාරට වෙන්කළ කොටස) ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් B උතුරට : එම ඉඩමේ ලොට් 5 සහ 6 ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් A ද, දකුණට : එම ඉඩමේ ලොට් 8 ද, බස්නාහිරට : එම ඉඩම් ලොට් 7 ද, මායිම්ව එකී අංක 1370 දරන පිඹුරට අනුව පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 35/68 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එල්. පී. ආරියසිංහ මිය,
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී.

ලංකා බැංකුව,
නිදහස් චතුරස්‍ර ශාඛාව.

05-176

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංකය : 80650878
ණය යොමු අංකය : 80651660

අලුත්ගම, කලුවාමෝදර, දේවාල පාර, අංක 74, හොටෙල් බ්ලු සැෆයර් සමාගමට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

1. වෙඩික්කාර උඩර්ම මන්දු රාජික් ද සිල්වා මහතා
2. දෙමුනි නාලනී සේපාලිකා ද සිල්වා මහත්මිය හවුල්කරුවෝ වෙති.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2019.03.29 දිනැති අංක 2117 දරන ගැසට් පත්‍රයේ හා 2019 මාර්තු 18 වැනි සඳුද දින ''දිනමිණ'' ''ඩේලිනිව්ස්'' හා ''තිනකරන්'' යන පුවත්පත්වල පළ කරන ලද නිවේදන වලට අනුකූලව මුල් ණය මුදල්වල ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අය විය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේදී ම 2019.05.27 වැනි දින පෙ. ව. 10.00 ට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, දකුණු කලුතර තොටමුනේ, අලුත්ගම් බැද්දේ නැගෙනහිර කලුවාමෝදර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බේරුවල ප්‍රාදේශීය සභා සීමාවේ (මාලේවන්බැද්ද උප කාර්යාලය) කලුවාමෝදර පිහිටි "වතුබොඩේ කුඹුර සහ මහඹිවිට හෙවත් මහකුඹුර" නමැති ඉඩමට එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු ඕ. එස්. බී. කුමාරසිරි විසින් සාදන ලද 2016 නොවැම්බර් මස 23 සහ 2016 දෙසැම්බර් මස 15 දිනැති අංක 4969 දරන පිඹුරෙහි ලොට් A ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම්, එකී ලොට් A උතුරට : මහගොඩැල්ල හෙවත් වතුබොඩඹිවිට සහ ලොට් B ද, නැගෙනහිරට : ලොට් B සහ දේවාල පාර ද, දකුණට : වැත්තහේවගේ ලියද්ද හෙවත් කොම්බුවපිටිය සහ බත්හැලිය කඩුන්ගෙවත්ත වතුබොඩඹිවිට හා අංක 1854 දරන පිඹුරෙහි ලොට් 3B (අඩි 10 පළල පාර) ද, බස්නාහිරට : 1741 දරන පිඹුරෙහි ලොට් 2C සහ එම ඉඩමේ ලොට් 1 සහ කඩවුන්ගෙවත්ත වතුබොඩඹිවිට ද මායිම්ව එකී අංක 4969 දරන පිඹුරට අනුව රූඩ් දෙකයි පර්චස් අටක (අ. 0, රූ. 2, පර්. 8) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කලුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 158/129 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම පහත විස්තර කර ඇති ඉඩමෙහි උප බෙදීමක නැවත මැනීමක් සහ ඒකාබද්ධ කිරීමකි :

1. බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, දකුණු කලුතර තොටමුනේ, අලුත්ගම් බැද්දේ නැගෙනහිර කලුවාමෝදර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බේරුවල ප්‍රාදේශීය සභා සීමාවේ (මාලේවන්බැද්ද උප කාර්යාලය) කලුවාමෝදර පිහිටි "මහඹිවිට හෙවත් ලොට් 3හි මහකුඹුර" නමැති ඉඩමට එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු ජී. එල්. ඩබ්. පෙරේරා විසින් සාදන ලද 2004 ජුනි මස 18 දිනැති අංක 2618 දරන පිඹුරෙහි ලොට් 3A ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල, එනම් එකී ලොට් 3A උතුරට : මහගොඩැල්ල හෙවත් වතුබොඩඹිවිට සහ දේවාල පාර ද, නැගෙනහිරට : දේවාල පාර සහ ගලබැන්ද ලියද්ද ද, දකුණට : ගලබැන්ද ලියද්ද සහ වතුබොඩඹිවිට ද, බස්නාහිරට : වතුබොඩඹිවිට සහ වටුවගෙ ලියැද්ද හෙවත් රදුන්ගෙවත්ත ද මායිම්ව එකී අංක 2618 දරන පිඹුරට අනුව රූඩ් එකයි පර්චස් දොළහයි දශම අටයි තුනක (අ. 0, රූ. 1, පර්. 12.83) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කලුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 158/49 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම බලයලත් මිනින්දෝරු එච්. පී. ද එස්. තාබ්‍රෑ විසින් මෑතකදී මැන සාදන ලද 2005 ජුනි මස 20 දිනැති අංක 1854 දරන පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත.

එකී කලුවාමෝදර පිහිටි "මහඹිවිට හෙවත් මහකුඹුර" නමැති ඉඩමට එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ඇතුළත් වූ එකී අංක 1854 දරන පිඹුරෙහි ලොට් 3A ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම්

කැබැල්ල නම් එකී ලොට් 3A උතුරට : මහගොඩැල්ල හෙවත් වතුබොඩඕවිට ද, නැගෙනහිරට : දේවාල පාර සහ ගලබැන්දලියද්ද (දැන් අඩි 10 පළල පාර, දකුණ : වතුබොඩඕවිට සහ අඩි 10 පළල පාර, ලොට් 3B සහ බස්නාහිරට : වතුබොඩඕවිට සහ වටුවගෙලියද්ද හෙවත් රදුන්ගෙවත්ත ද මායිම්ව එකී අංක 1854 දරන පිඹුරට අනුව රූඩ් එකයි පර්චස් එකොළහයි දශම නවයයි පහක (අ. 0, රූ. 1, පර්. 11.95) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ.

2. බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, දකුණු කලුතර තොටමුනේ, අලුත්ගම් බැද්දේ, අංක 762C කලුවාමෝදර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බේරුවල ප්‍රාදේශීය සභා සීමාවේ (මාලේවන්බැද්ද උප කාර්යාලය) කලුවාමෝදර පිහිටි "ලොට් 2 වතුබොඩේකුඹුර" නමැති ඉඩමට එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු එච්. පී. ද එස්. තාබෲ (එහෙත් බලයලත් මිනින්දෝරු ඒ. නිලූක එස්. ඩී. සිල්වා ලෙස ලියාපදිංචි) 2005 ජනවාරි මස 8 දිනැති (එහෙත් වඩාත් නිවැරදිව 2005 මාර්තු මස 8 දිනැති) අංක 1741 දරන පිඹුරෙහි ලොට් 2B1 ලෙස දක්වා ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2B1 උතුරට : ගාලු පාරේ සිට සීලානන්ද පාර දක්වා දිවෙන පාර ද, නැගෙනහිරට : ලොට් 2B2 (එහෙත් 2B ලෙස ලියාපදිංචි) සහ දෙනියගෙඕවිට හෙවත් මහකුඹුර සහ ලොට් 2B3 ද, දකුණට : වත්තහේවගේ ලියද්ද හෙවත් කොම්බුවපිටිය සහ බත්හැලිය ද, බස්නාහිරට : අඩි 10 පළල පාර (ලොට් 2C) සහ ලොට් 2A ද මායිම් එකී අංක 1741 දරන පිඹුරට අනුව පර්චස් තිස්හතක (අ. 0, රූ. 0, පර්. 37) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කලුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 158/47 හි ලියාපදිංචි කර ඇත.

3. එකී කලුවාමෝදර පිහිටි "වතුබොඩේ කුඹුර" නමැති ඉඩමේ එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ඇතුළත් වූ එකී අංක 1741 දරන පිඹුරෙහි ලොට් 2B3 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2B3 උතුරට : ලොට් 2B1 ද, නැගෙනහිරට : දෙනියගෙඕවිට හෙවත් මහකුඹුර ද, දකුණට : වත්තහේවගේ ලියද්ද හෙවත් කොම්බුවපිටිය සහ බත්හැලිය (ලොට් 2B1 ලෙස ලියාපදිංචි) ද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් 2B1 ද මායිම් ව එකී අංක 1741 දරන පිඹුරට අනුව පර්චස් එකයි දශම තුනයි දෙකක (අ. 0, රූ. 0, පර්. 1.32) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කලුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 158/48 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ගරුසිංහ මිය,
කළමනාකාරිණී.

ලංකා බැංකුව,
අලුත්ගම.

05-177

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කළින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි.

කිරුල මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0008 1001 6310.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.02.28 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව එකී රුපියල් දෙකෝටි අනූ අට ලක්ෂ දෙදහස් පනස් තුනයි ශත අනූ තුනක (රු. 29,802,053.93) මුදලද, 2019 ජනවාරි මස 16 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙලක්ෂ හැත්තෑ අට ලක්ෂ හතලිස් දහස් හාරසිය හැත්තෑ තුනයි ශත තිහක (රු. 27,840,473.30) මුදලක් සඳහා වාර්ෂිකව at the rate of Average Weighted Prime Lending Rate + Three Per centum (3%) Per annum (Floor Rate of 15%) හා තවත් රුපියල් හය ලක්ෂ අසූ නම දහසක (රු. 689,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළවක් (15%) බැගින් වූ පොලියද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.04.12 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.04.01 වැනි දින ''දිවයින'', සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2019.05.30 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

සබරගමුව පළාතේ, කැගල්ල දිස්ත්‍රික්කයේ, ගල්බොඩ කෝරළේ, මැද පත්තුවේ, මාවනැල්ල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහලේකම් කාර්යාල කොට්ඨාසාය තුළ හිඟුල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ඕවත්ත සහ හිඟුල ග්‍රාමයේ පිහිටි "මුත්තෙට්ටුවත්තේතැන්න වරාගොල්ලහේන" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ඩී. ඉද්දගොඩ අය විසින් සාදන ලද 2017 මැයි මස 15 දාතම හා අංක 2078 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පද්මා යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම, අඩි 10 පළල පාර සහ සකුන්තලා ඉඳුසායී, චම්පිකා ද සිල්වා, පද්මිණී ද සිල්වා, යූ. එම්. ආර්. යූ. රණවීර සහ තිස්ස ලියනගේ යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම් නැගෙනහිරට : යූ. එම්. ආර්. යූ. රණවීර, තිස්ස ලියනගේ, සිරිවර්ධන සහ චම්පිකා ද සිල්වා යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම, දකුණට : සිරිවර්ධන, චම්පිකා ද සිල්වා යන අය

විසින් හිමිකම් කියනු ලබන ඉඩම, ඕවත්ත පාර සහ පද්මා, සකුන්තලා ඉඳුසායී, චම්පිකා ද සිල්වා යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම් සහ බස්නාහිරට : චම්පිකා ද සිල්වා යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම, ඕවත්ත පාර පද්මා යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම, අඩි 10 පළල පාර සහ සකුන්තලා ඉඳුසායී, චම්පිකා ද සිල්වා, පද්මිණී ද සිල්වා යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර හතරයි පර්චස් හයයි දශම එකයි බිංදුවක් (A: 4, R: 0, P: 6.10) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2078 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව H 189/123 යටතේ කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

05-169

---

## මහජන බැංකුව - කළුතර ශාඛාව

### 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 අංක 29 දරන ඇ වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණ උතුර, කළුතර බද්දෙහි කලුතර ප්‍රාදේශීය සභා බලසීමාව තුළ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 729 පුලර්ටන් ග්‍රාම නිලධාරි වසමේ, නාගොඩ පිහිටි ''කොබෙයිහෙළකුඹුර'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. පී. ද එස්. තාබෲ මහතා විසින් 2003.02.22 දින මැන සකස් කරන ලද අංක 1010 දරන පිඹුරේ ලොට් අංක සී දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් දහසයයි දශම අටක් වූ (අ. 0, රූ. 0 පර්. 16.8) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු ගොඩනැගිලි ඇතුළු දේ ද වේ.

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2019 මැයි 26 ප. ව. 2.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2019.04.26 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ ද, 2019.04.25 වැනි දින දිනමිණ සහ ඩේලිනිව්ස් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසෙන මාර්ගය.* - කළුතර මහජන බැංකුවේ සිට ගාලු පාරේ කටුකුරුන්ද හංදිය දක්වා ගොස් එතැනින් කළුතර නාගොඩ පාරට හැරී කි. මී. 2.5ක් පමණ යන විට හමුවන නාගොඩ හංදියෙන් වම්පසට පිහිටි පාළාතොට ආරම්භ වන ස්ථානයේ පාරේ වම් පස මෙම ව්‍යාපාරික ගොඩනැගිල්ල සහිත ඉඩම පිහිටා තිබේ.

*ගෙවීමේ ක්‍රමය.* -

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000ක් ද,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහිතකය හා මුද්දර ගාස්තු ද.

ගැනුම් මිලෙන් 90%ක් වූ මුදල විකුණුම් දින 30ක් ඇතුළත ප්‍රධාන කළමණාකරු (අයකිරීම්) මහජන බැංකුව, පානදුර නගර ශාඛාව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කළුතර) අංක 341, ගාලු පාර පානදුර යන ලිපිනය වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක 038 - 2232438, 2241596, 4283182, 2235401
ෆැක්ස් අංකය 038 - 2232727

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30) ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාමවිනිසුරු (මුළු දිවයිනටම).

අංක 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකතන අංක 011- 2053286/072 - 3207533
076 - 9217329/ 072 -0881044.

05-147

---

## මහජන බැංකුව - මතුගම ශාඛාව

### අංක 1986 අංක 32 දරන පනත මගින් සංශෝධිත 1961 29 දරන ඇ වගන්තිය යටතේ වෙන්දේසියේ විකුණුම් දැන්වීම

(1) බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණ උතුර, කළුතර බද්දෙහි කළුතර නගර සභා බලසීමාව තුළ, කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 729 බී නාගොඩ ග්‍රාම නිලධාරි වසමේ, නාගොඩ ග්‍රාමයේ, පිහිටි ''පිගොන්එළිය හෙවත් ඕනන් එස්ටේට්'' නමැති ඉඩමට අවසරලත් මිනින්දෝරු එච්. පී. ඒ. ජයවික්‍රම

මහතා විසින් 2007.04.12 වැනි දින මැන සහතික කරන ලද අංක 10865 දරන පිඹුරේ ලොට් අංක 3A[2] දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් දහසයක් වූ (අ. 0 රූ. 0 පර්. 16) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ පළතුරු ගොඩනැගිලි ඇතුළුව මාර්ග අයිතිය ද වේ. (2) ''පිගොන්එළිය හෙවත් ඕනන් එස්ටේට්'' නමැති ඉඩමට අවසරලත් මිනින්දෝරු යූ. ජේ. සී. මුදලිගේ මහතා විසින් 2013.09.30 දින මැන සහතික කරන ලද අංක 598 දරන පිඹුරේ ලොට් අංක 1 දරන ඉඩම ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් නමයක් වූ (අ. 0 රූ. 1 පර්. 9) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු ගොඩනැගිලි ඇතුළුව මාර්ග අයිතිය ද වේ. (3) ''පිගොන්එළිය හෙවත් ඕනන් එස්ටේට්'' නමැති ඉඩමට අවසරලත් මිනින්දෝරු වයි. කේ. ඩී. ඒ. සේනාරත්න මහතා විසින් 2013.09.20 දින මැන සහතික කරන ලද අංක 2633 දරන පිඹුරේ ලොට් අංක 3 A දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් දසයක් වූ (අ. 0 රූ. 0 පර්. 16) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු ගොඩනැගිලි ඇතුළුව මාර්ග අයිතිය ද වේ.

මහජන බැංකුවෙන් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2019 මැයි 26 පෙ. ව. 10.30 දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩි විස්තර සඳහා* .- 2019.04.26 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2019.04.25 වැනි දින දිනමිණ සහ ඩේලිනිවුස් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.* - මතුගම මහජන බැංකුවේ සිට මතුගම කළුතර පාරේ කි. මී. 17ක් ගිය විට නාගොඩ හංදිය හමුවේ. එතැනින් වමට ඇති කටුකුරුන්ද දක්වා දිවෙන මාර්ගයේ කි. මී. 1ක් ගිය විට හමුවන සෙන්ට්‍රල් හංදියේ සේවා මධ්‍යස්ථානයක් හැරෙන මාර්ගය පසුකර තවත් මීටර් 200ක් ගියවිට වම් පස තාප්ප දෙකකින් මායිම් වූ අඩි 12ක ප්‍රවේශ මාර්ගය හමුවේ. එම මාර්ගයේ මීටර් 25ක් ගිය විට අදාළ දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.* -

1. ගැනුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000ක් ද,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද.

ගැනුම් මිලෙන් 90%ක් වූ මුදල විකුණුම් දින 30ක් ඇතුලත ප්‍රධාන කළමණාකරු (අයකිරීම්) මහජන බැංකුව පානදුර නගර ශාඛාව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කළුතර) අංක 341, ගාලු පාර, පානදුර යන ලිපිනය වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක 038 - 2232438, 2241596, 4283182, 2235401 ෆැක්ස් 038 - 2232727

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30) ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු සාමවිනිසුරු (මුළු දිවයිනටම)

අංක 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකතන අංක 011 - 2053286/072-3207533
076-9217329/072-0881044

05-146

---

**මහජන බැංකුව - නුවරඑළිය ශාඛාව**

**1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 D වගන්තිය යටතේ විකුණුම් දැන්වීම**

**ඉතා වටිනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ, ඔයපළාත කෝරලේ නුවර එළිය ප්‍රාදේශීය සභාව හා නුවරඑළිය නගර සභාව තුළ අංක 535 1 බුළු ඇල ග්‍රාම නිලධාරී වසමේ බොරලන්ද ගමේ පිහිටි ''පීඩෲ එස්ටේට්'' නමැති ඉඩමට බලයලත් මානක එස්. පී. රත්නායක විසින් මැන සාදන ලද අංක 1078 දරන 1997.01.11 දිනැති පිඹුරේ නිරූපිත ලොට් 01 නමැති ඉඩම් කොටස

මෙම ඉඩමේ වපසරිය අ. 0 රූ. 0 පර්. 30.48

එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ වගාව ඇතුළු මාර්ග අයිතිය ද සමග වේ.

ඉහත සඳහන් ඉඩම මෑතක දී කරන ලද මැනුමකට අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඔයපළාත කෝරලේ නුවරඑළිය ප්‍රාදේශීය සභාව හා නුවරඑළිය නගර සභාව සීමාව තුළ අංක 535 1 බුළු ඇල ග්‍රාම නිලධාරී වසමේ බොරලන්ද ගමේ පිහිටි ''පීඩෲ එස්ටේට්'' නමැති ඉඩමට බලයලත් මානක නිමලා ලියනගේ විසින් මැන සාදන ලද අංක 959 දරන 2013.03.04 දිනැති පිඹුරේ නිරූපිත ලොට් 01 නමැති ඉඩම් කොටස.

මෙම ඉඩමේ වපසරිය අ. 0, රූ. 0, පර්. 30.48

එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු මාර්ග අයිතිය ද සමග වේ.

මෙය නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම/පත්ඉරුව ඒ 176/49 යටතේ ලියාපදිංචි කර ඇත.

*දේපලට පිවිසීම.* - නුවරඑළියේ සිට උඩුපුස්සැල්ලාව පාරේ කි. මී. 3ක් පමණ ගමන් ගත් විට මෙම දේපල පාරේ දකුණුපසින් පාරට මායිම්ව පිහිටා ඇත.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය මත 2019ක් වූ මැයි මස 28 වැනි අඟහරුවාද පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2018.10.19 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* හා 2018.10.27/09 වැනි දින දිනමිණ, තිනකරන් සහ ඩේලි නිව්ස් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* -වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක් විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%,
4. ලිපිකරු සහ නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම ගාස්තු,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය කළමණාකාරු, මහජන බැංකුව, නුවරඑළිය ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය, අංක 40, උද්‍යාන පාර, නුවරඑළිය වෙත ගෙවිය යුතු ය. දුරකතන අංක 052 - 2222557/052 - 2222555.

ඉහත සඳහන් කරන ලද මුදල් දින 30ක් ඇතුළත නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වරලත් වෙන්දේසිකරුවෝ.
(රාජ්‍ය හා පෞද්ගලික බැංකුකරුවන් වෙනුවෙන්
සහ උසාවි කොමසාරිස්වරු.)

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.com

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
6 ඒ, ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08
දුරකථන අංක : 011-2671467, 011- 2671468
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2671469
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

05-144

## අගනා දේපල වෙන්දේසියක්

කොළඹ දිසා අධිකරණයේ දී ය.

ලොරෙන්සු හේවාගේ කරුණාවතී පෙරේරා,
අංක 46/16, නෙල්ලිගහවත්ත, මීගමු පාර,
පෑලියගොඩ.

.............*පැමිණිලිකාරිය.*

එදිරිව

1. ලොරෙන්සු හේවාගේ ලීලාවතී පෙරේරා
අංක 76/2, ගොඩකඳුරවත්ත,
පෑලියගොඩ.

*නඩු අංකය :* ඩීපීජ්. 00024/12
*ස්වාභාවය :* බෙදුම්

2. ලොරෙන්සු හේවාගේ ආරියවතී පෙරේරා,
අංක 76/2, ගොඩකඳුරවත්ත,
පෑලියගොඩ.

3. ලොරෙන්සු හේවාගේ ධර්මදාස පෙරේරා,
අංක 10, නෙල්ලිගහවත්ත, මීගමුපාර,
පෑලියගොඩ.

4. ලොරෙන්සු හේවාගේ චන්ද්‍රදාස පෙරේරා,
අංක 46/16, නෙල්ලිගහවත්ත, මීගමු පාර,
පෑලියගොඩ.

5. (අ) ලොරෙන්සු හේවාගේ නාලක සංජීව පෙරේරා,
(ආ) ලොරෙන්සු හේවාගේ ප්‍රභාත් සුරංග පෙරේරා,
(ඇ) ලොරෙන්සු හේවාගේ රුක්මන් සංජීව පෙරේරා.

*සියල්ලෝම*

අංක 9/1, නෙල්ලිගහවත්ත, මීගමුපාර,
පෑලියගොඩ.

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් කර ඇති විකිණීම සඳහා වූ අධිකාරි පත්‍රය අනුව මෙම නඩුවට අදළ පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, මෙම නඩුවේ පැමිණිලිකාරියට සහ 1,2,3,4 වැනි විත්තිකරුවන්ට නොබෙදූ 1/6 පංගුව බැගින් සහ 5අ, 5ආ, සහ 5 ඇ විත්තිකරුවන්ට නොබෙදූ 1/18 පංගුව බැගින් හිමිවිය යුතු බවට එකී අධිකරණය විසින් තීරණය කරනු ලැබ ඇති හෙයින්, එකී උපලේඛනයේ කැබැලි අංක ඒ ලෙස නිරූපිත ගොඩනැගිල්ල සමග ඉඩම ප්‍රමාණය අනුව කැබැලිවලට වෙන්කළ නොහැකි බැවින් අධිකරණ නියෝගයක් අනුව එකී දේපල ම විසින් 2019 ජූනි මස 06 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

තවද, මෙම දේපළ තුල පවතින වැඩි දියුණු කිරීම් සඳහා වන්දිය 3 වන විත්තිකරුට හිමිවිය යුතු බවට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇත.

ප්‍රථමයෙන් මෙම දේපල පාර්ශ්වකරුවන් අතර වෙන්දේසි කරනු ලබන අතර ඔවුන්ගෙන් ලංසුවක් ඉදිරිපත් නොවුනහොත් හෝ ඔවුන්ගේ ලංසුව තක්සේරු මුදල වන රුපියල් හතලිස් දෙලක්ෂය (රු. 4,200,000) වඩා අඩුවුවහොත් ප්‍රසිද්ධ වෙන්දේසිය සඳහා යොමු කරනු ලැබේ.

එකී වෙන්දේසියේ දී ඉහළම ලංසුතබන්නා ගැනුම්කරු වන අතර එකී ගැණුම්කරු එවේලේ ම ගැණුම් මිලෙන් සියයට විසිපහක (25%) මුදලක් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු අතර ඉතිරි සියයට හැත්තෑපහ (75%) දින තිහක් (30) ඇතුළත කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය. තවද, ගැණුම්කරු විසින් ගැණුම් මිල මත වෙන්දේසිකරුගේ 2 1/2% කොමිස් මුදල, 1% මහ නගර සභා ගාස්තු සහ වෙන්දේසිය පැවැත්වීම සඳහා දරන ලද සම්පූර්ණ වියදම එවෙලේ ම වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ (දැනට ගම්පහ), රාගම් පත්තුවේ අළුත්කුරු කෝරළේ පැලියගොඩ පිහිටි නෙල්ලිගහවත්ත නැමැති ඉඩමට එම්. ඩී. ජේ. වී. පෙරේරා, බලයලත් මිනින්දෝරු තැන විසින් 1976.11.20 දින මැන සාදන ලද අංක 3995 දරන පිඹුර ප්‍රකාර ලොට් 4 නම් කැබැල්ල වන උතුරට : එකී අංක 3995 පිඹුරේ ලොට් 3 ද, නැගෙනහිරට : පාර ද, දකුණට : දෙස්තර මදනායකට අයත් ඉඩම ද, බස්නාහිරට එකී අංක 3995 පිඹුරේ ලොට් 1 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් 4ක් (අ. 0, රූ. 0, පර්. 4) ක් විශාල ඉඩම. මෙම නඩුවේ කාර්යය සඳහා (වයි) ලෙස දක්වා ඇති දෙවන උපලේඛනයේ විස්තර කර ඇති බෙදා වෙන්කිරීමට යෝජිත විෂය වස්තුව වන බලයලත් මිනින්දෝරු ටී. වයිරපිල්ලේ මහතා විසින් මැන සාදන ලද අංක 171 සහ 2016.02.18 දිනැති මූලික පිඹුරේ කැබලි අංක ඒ දරන කොටස.

ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න,
වෙන්දේසිකරු/තක්සේරුකරු සහ
උසාවි කොමසාරිස්.

220/5, දිමුතු මාවත,
ගම්පහ පාර, යක්කල.
දුරකතන අංක : 071-8208360, 033- 2222568, 011- 2787314.

05-101

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.- අම්බලන්ගොඩ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, වැල්ලබොඩ පත්තුවේ, කරන්දෙණිය ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 93සී මණ්ඩකන්ද ග්‍රාම නිලධාරි වසමේ, කරන්දෙණිය මණ්ඩකන්ද හි පිහිටි ''කජුගහවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. කන්නන්ගර විසින් 2013 අගෝස්තු මස 02 වැනි දින මැන සාදන ලද අංක 862/2013 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් ''බී'' දරන

ප්‍රමාණය : රූඩ් තුනයි පර්චස් විසිහතරයි දශම අටයි පහ (අ. 0, රූ. 3, පර්. 24.85)ක් විශාල ඉඩම සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

තුයියා හැන්නැදිගේ සරත් කුමාර සහ කළු ආරච්චිගේ දූලිකා රුවන්මලී පෙරේරා ණයකරුවන් වශයෙන් සහ තුයියා හැන්නැදිගේ සරත් කුමාර උකස්කරු වශයෙන් ද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2019ක් වූ මැයි මස 31 වැනි දින පෙ. ව. 11.30 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2019.02.22 වැනි දින රජයේ ගැසට් පත්‍රයද, 2019.02.26 වැනි දින මව්බිම, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2019.05.13 වැනි දින මව්බිම, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - අම්බලන්ගොඩ සිට ඇල්පිටිය දෙසට යන ප්‍රධාන පාරේ කිලෝමීටර් 13ක් පමණ කුරුදුගහහැතැක්ම නගර මධ්‍යය දක්වා ඉදිරියට ගමන් කර තලාව/මණ්ඩකන්ද පොදු පාරට වමට හැරී මණ්ඩකන්ද ග්‍රාමීය බැංකු හංදිය දක්වා කිලෝමීටර් 2.5ක් ගමන් කර සමුපකාර ග්‍රාමීය බැංකුවට ඔබ්බෙන් මීටර් කිහිපයක් ගිය විට පාරේ කන්ද මුදුන පිහිටි තැන දී මහීදණ්ඩ දෙසට (තොරණ හංදිය පාර ලෙස හඳුන්වන පාර) ප්‍රාදේශීය සභා පාරට වමට හැරී මීටර් 250ක් පමණ ගමන් කර මිනුම් සැලැස්මට අනුව පාර සඳහා වෙන්කිරීමකට වමට හැරී තවත් මීටර් 50ක් පමණ ගමන් කළ විට දේපළ වෙත පිවිසිය හැක.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%) (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක

වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම්කරු විසින් එකතු කළ වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි. (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ අම්බලන්ගොඩ ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.,
අංක 26, ගාලු පාර,
අම්බලන්ගොඩ.
දුරකතන අංක 091- 2255198
ෆැක්ස් අංකය : 091-2256490.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල උසාවි පාර, කොළඹ 12
දුරකතන අංක 011- 2445393/011-2396520
ෆැක්ස් අංකය : 011 - 2445393
ඊමේල් : senaservice84@gmail.com

05-127

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - අතුරුගිරිය ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව්. 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පෝරේ 489 ග්‍රාම නිලධාරි වසමේ, පෝරේ ගමේ හි පිහිටි ''අම්පිටියවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු යූ. කේ. පී. එස්. පුෂ්පකුමාර විසින් 2007 සැප්තැම්බර් මස 20 වැනි දින මැන සාදන ලද අංක 1291 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1බී1 දරන

ප්‍රමාණය : රූඩ් එකයි පර්චස් එකයි (අ. 0 රූ. 1 පර්. 1) විශාලත්වයෙන් යුත් ඉඩම සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සියළු දේත් සමඟ වේ.

බලයලත් මිනින්දෝරු ඩී. පී. ඒ. ජයසිංහ විසින් 1973 ජනවාරි 20 වැනි දින මැන සාදන ලද අංක 4946 දරන පිඹුරේ ලොට් 6 සහ බලයලත් මිනින්දෝරු යූ. කේ. පී. එස්. පුෂ්පකුමාර විසින් 2007 සැප්තැම්බර් මස 20 වැනි දින මැන සාදන ලද අංක 1291 දරන පිඹුරේ ලොට් "R" සඳහා වෙන් කරන ලද මාර්ගය මතුපිටින් ඒ දිගේ එහා මෙහා යාම සහ අනෙකුත් සියලුම අයිතීන් සමඟ පහත සඳහන් වේ:-

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ පෝරේ ගමේ හි පිහිටි ''අම්පිටියවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු යූ. කේ. පී. එස්. පුෂ්පකුමාර විසින් 2007 සැප්තැම්බර් මස 20 වැනි දින මැන සාදන ලද අංක 1291 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් R

*ප්‍රමාණය* .- පර්චස් එකයි දශම තුනයි බිංදුව (අ. 0 රූ. 0 පර්. 1.30)

ඉහත සඳහන් ''අම්පිටියවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. පී. ඒ. ජයසිංහ විසින් 1973 ජනවාරි මස 20 වැනි දින මැන සාදන ලද අංක 4946 දරන පිඹුරෙන් බෙද වෙන් කරන ලද ලොට් 6 (අඩි 10ක් පළල පාර)

*ප්‍රමාණය.* - පර්චස් දහනවයයි (අ. 0 රූ. 0 පර්. 19)

ගොඩමුණ විතානගේ ප්‍රියන්ත ණයකරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ වර්ෂ 2019 ක් වූ මැයි මස 27 වැනි දින පෙ. ව. 11.00 ට ඉහත ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2017.08.25 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද*, ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරි පුවත්පත් ද බලන්න. 2019.05.10 වැනි දින මව්බිම, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - අතුරුගිරිය හන්දියේ සිට කොළඹ පාරේ මීටර් 600ක් පමණ ගමන් කර පෝරේ පන්සල පසු වනවාත් සමඟම දකුණට හැරුණු විට තිබෙන සීලවිමල මාවතේ මීටර් 400ක් පමණ ගමන් කළ විට පෝරේ ප්‍රාථමික පාසල හමුවේ. එතැනින් දකුණට හැරුණු විට ඇති බොරළු පාරේ මීටර් 100ක් පමණ ගමන් කළ විට "T" හන්දිය හමුවේ. එතැනින් දකුණට හැරී මීටර් 50ක් පමණ ගමන් කළ විට අදාළ විෂය ගත දේපළ දකුණු පස පැත්තේ පාරේ ඉදිරිපසින් පිහිටා තිබේ. එම පාරේ වම් පසට නැඹුරු වූ වංගුව පසු වනවාත් සමගම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%) (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද

සියලුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම්කරු විසින් එකතු කළ වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි. (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ අතුරුගිරිය ශාඛාවේ තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල උසාවි පාර, කොළඹ 12
දුරකතන අංක 011- 2445393/011-2396520
ෆැක්ස් අංකය : 011 2445393
ඊමේල් : senaservice84@gmail.com

කළමණාකරු,
කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.,
අංක 51, මහ වීදිය,
අතුරුගිරිය.
දුරකතන අංක 011 2762875/0112762895 -6
ෆැක්ස් අංකය : 011- 2762874.

05-128

---

**මහජන බැංකුව - ආයතනික ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරන මහජන බැංකු පණතෙහි 29D වන වගන්තිය යටතේ විකිණීම

වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - ලියනගේමුල්ල, සීදූව

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ, මීගමුව ලියාපදිංචි කොට්ඨාසයට අයත් කටුනායක - සීදූව නගරසභා සීමාවට අයත්, ලියනගේමුල්ල, ග්‍රාමයේ පිහිටි, කුරුවේමුදියන්සේලාගේ කුරුදුවත්ත ලෙස හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු වයි. එම්. රංජිත් යාපා විසින් සාදන ලද, 2003 ජනවාරි මස 30 වන දිනැති අංක 9082A දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය, ඉඩමේ ප්‍රමාණය අක්. 0, රූ. 0, පර්. 20 (හෙක්ටයාර 0.0506) එහි පිහිටි ගොඩනැගිලි වගාවන් සහ සියල්ල සහිතව පහත දැක්වෙන බිම් කට්ටිය හරහා වැටී ඇති මාර්ග අයිතිය ද සමග :

ලියනගේමුල්ල ග්‍රාමයේ පිහිටි, කුරුවේමුදියන්සේලාගේ කුරුදුවත්ත ලෙස හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු එම්. ජේ. සේතුංග විසින් සාදන ලද, 1986 නොවැම්බර් මස 27 වන දිනැති අංක 2586 දරන පිඹුරේ ලොට් අංක D ලෙස දැක්වෙන (අඩි 15 ක් පළල මාර්ගයක් සඳහා වෙන් කර ඇත.) සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

*දේපළ වෙත පිවිසීම.*- කොළඹ සිට කොළඹ - මීගමුව ප්‍රධාන පාරේ කිලෝමීටර් 15 ක් පමණ ගොස් සීදූව මංසන්ධියට පැමිණ එතැන් සිට කිලෝමීටර් 2 ක් පමණ එම මාර්ගයේම ගොස් එයාර්පෝට් ගාඩින් හෝටලය දක්වා පැමිණෙන්න. අදාල දේපළ එම පාරේ දකුණු පසින් පිහිටා ඇත.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2019 මැයි මස 30 වෙනි දින (බ්‍රහස්තින්දා) පෙ.ව.11.00 ට පිහිටි ස්ථානයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

අදාළ දේපළ සී/ස දයාරත්න සහ සමාගම (පුද්ගලික) විසින් මහජන බැංකුවට උකස් කරන ලද්දකි.

තීරණය පිළිබඳ දැන්වීම සඳහා කරුණාකර 2009 අගෝස්තු මස 28 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2 ක් (සියයට දෙකහමාරක්)
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.00
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු.

ගැනුම් මිලෙන් 90% (සියයට අනූව) ක් වූ ඉතිරියද වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත සහකාර සාමාන්‍යාධිකාරී - අයකරගැනීම්, ආයතනික බැංකු ශාඛාව, මහජන බැංකුව, ප්‍රධාන කාර්යාලය, 10 වන මහල, සර් චිත්තම්පලම් ගාර්ඩිනර් මාවත, කොළඹ 02 වෙත ගෙවිය යුතු වේ. දුරකතන අංක 011- 2481613, 011-2334281, 011- 2481546.

ඔප්පුව පිළිබඳ සහ අනෙකුත් විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කල පරිදි දින 30ක් ඇතුලත ඉහත සඳහන් කරන ලද මුළු මුදල ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතු වේ.

''ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි''

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 127 ක සේවා විශිෂ්ටත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය :*
6 A, ෆෙයාර් ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08
දුරකථන අංක : 011-2671467, 011- 2671468
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2671469
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

05-86

---

**හැටන් නැෂනල් බැංකුව පී. එල්. සී. - මොරටුව ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 4 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසියේ විකිණීම

**ඉහතින් සඳහන් කළ පළමු සටහනට අනුව**

බලයලත් මිනින්දෝරු එස්. ඒ. සී. ජී. සිරිසෝම විසින් පිළියෙල කරන ලද 2007.11.17 දිනැති අංක 7135 දරන පිඹුරුපතෙහි ලොට් අංක A ලෙස සඳහන් සීමා නිර්ණය කොට බෙදා වෙන් කරන ලද නදීබ්ඩවත්ත ඉඩම එහි ඇති ගොඩනැගිලි ඇතුළු සියල්ල සමඟම බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්ද, පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පානදුර ප්‍රාදේශීය සභාවේ කෙසෙල්වත්ත උප කාර්යාලයීය සීමාවේ පරට්ට බටහිර ග්‍රාම නිලධාරී වසමේ අංක 672 D හි පිහිටා ඇති ඉඩම, ලොට් අංක A ඉඩම උතුරු සීමාවෙන් ලොට් අංක 06 පිඹුරුපත් අංක 117/1982 ට අනුව, නැගෙනහිර සීමාව (අඩි 20 ක් පළල) ප්‍රවේශ මාර්ගය මගින් හා බලයලත් මිනින්දෝරු ජී. ජී. සී. හස්තනාක විසින් 1996 පෙබරවාරි 04 වන දින සකසන ලද පිඹුරුපත් අංක 528 ට අනුව ලොට් අංක 1 මගින් ද, දකුණු සීමාව ලොට් අංක 109, 110 පිඹුරුපත් අංක 117/1982 ට අනුව හා ලොට් අංක 1 පිඹුරුපත් අංක 528 මගින් ද බටහිරින් ලොට් අංක 77 සහ 06 යන ඉඩම් මගින් පිඹුරුපත් අංක 117/1982 ට අනුව මායිම් වන ඉඩමේ ප්‍රමාණය අංක 7135 දරන පිඹුරු පතට අනුව රූඩ් එකයි පර්චස් තිස්පහයි දශම හතරකි. (A0, R1, P35.4)

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්ලිව් පෙරේරා හමුවේ 2016 ජූලි 26 වන දින දිවුරුම් දුන් පරිදි අංක 6031 යන ණය උකස් බැඳුම්කරය සඳහා නානයක්කාර වාසන් කරිග්ගවත්තගේ සෙනරත් ජයසූරිය අධ්‍යක්ෂ පැරඩයිස් ලංකා මාර්කටින් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන උකස්කරු උක්ත දේපළ සඳහා පොරොන්දු වූ පරිදි හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී වෙත ගෙවීම් පැහැර හැර ඇත.

ඉහත සඳහන් කළ දේපළ 2019 මැයි මස 29 වැනි බදාදා දින පෙරවරු 10.30ට ඉඩම පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් විකිණෙනු ලබන බව දැනුම් දෙමි.

*දේපළ සඳහා වූ ප්‍රවේශය :-* මොරටුව - පානදුර පරණ පාරේ දිගේ කෙසෙල්වත්ත ප්‍රදේශයේ කිලෝමීටර 5 ක් ගිය තැන පරට්ට මාර්ග හන්දියෙන් වමට හැරී පරට්ට මාර්ගය දිගේ කිලෝමීටර 1.8 ක් ගමන් කොට කවාකාර මාර්ග හන්දියක් හමුවේ. එතැනින් වමට හැරී මීටර් 80 ක් පමණ ගිය තැන අදාළ දේපළ සහිත ඉඩම ඔබගේ වම්පසට වන්නට මෙම අතුරු මාර්ගයේ පිහිටා ඇත. (දේපළ වෙළඳාම් සිදුකරන ස්ථානයට ප්‍රතිවිරුද්ධව)

නිවේදනය සඳහා කරුණාකර 2019 මාර්තු 15 වන දිනැති රජයේ *ගැසට් පත්‍රය* සහ 2019 මාර්තු 28 වන දිනැති ඩේලි මිරර්, මව්බිම සහ තිනක්කුරල් යන පුවත් පත් බලන්න.

**ඉහතින් සඳහන් කළ දෙවන සටහනට අනුව**

බලයලත් මිනින්දෝරු ඩී. ආර් කුමාරගේ විසින් පිළියෙල කරන ලද 1998 දෙසැම්බර් 16 වන දිනැති අංක 666 දරන පිඹුරුපතෙහි ලොට් අංක 19D ලෙස සඳහන් සීමා නිර්ණය කොට බෙදා වෙන් කරන ලද දොලේවත්ත ඉඩම එහි ඇති ගොඩනැගිලි ඇතුළු සියල්ල සමඟම බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුණේ පානදුර තල්පිටි දෙබැද්ද පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පානදුර ප්‍රාදේශීය සභාවේ කෙසෙල්වත්ත උප කාර්යාලයීය සීමාවේ පරට්ට ග්‍රාම නිළධාරී වසමේ අංක 672 A හි පිහිටා ඇති තක්සේරු අංක 134/1, පරට්ට පාර, පරට්ට කෙසෙල්වත්තේ පිහිටි, ලොට් අංක 19 D ලෙස සඳහන් ඉඩම උතුරු සීමාවෙන් එම්. ආර්. ප්‍රනාන්දු මහතාගේ ඉඩම මගින්ද, නැගෙනහිර සීමාව ලොට් අංක 19 C මගින් ද පිඹුරුපත් අංක 666 ට අනුව දකුණු සීමාව ලොට් අංක 19A (ප්‍රවේශ මාර්ගයට අඩි 10 ක් වෙන් කර ඇත) පිඹුරුපත් අංක 666 ට අනුව හා බටහිරින් ලොට් අංක 19 E මගින් පිඹුරුපත් අංක 666 ට අනුව මායිම් වන ඉඩමේ ප්‍රමාණය අංක 666 දරන පිඹුරුපතට අනුව පර්චස් දහයකි. (අ. 0, රූඩ්. 0 පර්. 10)

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්ලිව්. පෙරේරා හමුවේ 2014 ජුනි 05 වන දින දිවුරුම් දුන් පරිදි අංක 4524, 2016 ඔක්තෝබර් 19 වන දින දිවුරුම් දුන් පරිදි අංක 5407 හා 2018 ජූලි 26 වන දින දිවුරුම් දුන් පරිදි අංක 6030 යන ණය උකස් බැඳුම්කර සඳහා බොවිතන්ත්‍රි චාමිලා මනෝහරී අධ්‍යක්ෂ පැරඩයිස් ලංකා මාර්කටින් සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන උකස්කරු උක්ත දේපළ සඳහා පොරොන්දු වූ පරිදි හැටන් නැෂනල් බැංකුව පීඑල්සී වෙත ගෙවීම් පැහැර හැර ඇත.

ඉහත සඳහන් කළ දේපළ 2019 මැයි මස 29 වන බදාදා දින පෙරවරු 11.30 ට ඉඩම පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් විකිණෙනු ලබන බව දැනුම් දෙමි.

*දේපළ සඳහා වූ ප්‍රවේශයඃ-*

මොරටුව පානදුර පරණ පාරේ දිගේ කෙසෙල්වත්ත ප්‍රදේශයේ කිලෝමීටර 5 ක් ගිය තැන පරට්ට මාර්ග හන්දියෙන් වමට හැරී පරට්ට මාර්ගය දිගේ කිලෝමීටර 1.5 ක් ගමන් කොට දොලේවත්ත හන්දියට පැමිණ එතැනින් දකුණට අඩි 10 ක් පළල ප්‍රවේශ මාර්ගයට හැරී මීටර් 5 ක් පමණ ගිය තැන (නිසල පෙදෙස මාර්ගයට යාබදව) අදාළ දේපළ සහිත ඉඩම ඔබගේ වම්පසට වන්නට මෙම අතුරු මාර්ගයේ පිහිටා ඇත.

නිවේදනය සඳහා කරුණාකර 2019 මාර්තු 15 වන දිනැති රජයේ *ගැසට් පත්‍රය* සහ 2019 මාර්තු 28 වන දිනැති ඩේලි මිරර්, මව්බිම සහ තිනක්කුරල් යන පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමයඃ*

මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් ප්‍රමාණයන් මිටිය පහත හෙලීමත් සමගම ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් පාලන බලධරයා වෙත ගෙවිය යුතු පළාත් විකිණීමේ බද්ද වශයෙන් 1% ක මුදල (සියයට එකක්)
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වන විකිණීමේ මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්)
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු ඇත්නම්
6. විකිණීමේ සහතිකය සඳහා වූ මුද්දර ගාස්තුව

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරියද ශ්‍රී ලංකා රජය විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම්ද වෙතොත් ඒවාද සමඟ වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතුය.

හිමිකම් ඔප්පුව සහ අනෙකුත් අදාළ ලියකියවිලි පහත සඳහන් නිලධාරියාගෙන් පරීක්ෂා කර බැලිය හැක.

සහකාර සාමාන්‍යාධිකාරී - අයකර ගැනීම්, හැටන් නැෂනල් බැංකුව (පීඑල්සී) අංක ඃ 479, ටී. බී. ජායා මාවත, කොළඹ 10.

දුරකතන අංක ඃ 011-2661816,/ෆැක්ස් අංක 2661835.

ඩැලස් කෙලාට්,
බලයලත් වෙන්දේසිකරුවන්.

අංක 146/3, කල්දේරා උද්‍යානය, පහළ දුටුගැමුණු වීදිය, කොහුවල.
දුරකථන ඃ 0114367467, 011-4367111 aucslk@gmail.com.

05-174

---

**ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම මෝටර් වාහන (ඩී එෆ් සී සී වර්ධන බැන්ක් පීඑල්සී හි අනුප්‍රාප්තික) ඩී එෆ් සී සී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් සිසිල් පී. රාජරත්න විසින් ලියා සහතික කරන ලද 2017.04.06 දිනැති අංක 3406 හා 2017.07.26 දිනැති අංක 3477 දරන උකස් බැඳුම්කරයන් මත අයවිය යුතු ගෙවීම් කිරීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සමාගම් පනත යටතේ අංක PV 3219 දරන ලියාපදිංචි අංකය යටතේ යථා පරිදි ලියාපදිංචි කරන ලද සමාගමක් වන සිය ලියාපදිංචි කාර්යාලය, මහනුවර පවත්වාගෙන යන ඩබ්ලිව්. ඩී. ආර්. සමරකෝන් ඇන්ඩ් සන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පැහැර හැර ඇත.

**අංක 3406 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

| *ලියාපදිංචි අංකය* | *විස්තරය, නිෂ්පාදනය, මාදිලිය, අශ්වබල යනාදිය* | *චැසි අංකය* | *එන්ජින් අංකය* | *තබා ඇති ස්ථානය* |
|---|---|---|---|---|
| CP CAA -5310 | ටොයොටා ලෑන්ඩ් කෲසර් මෝටර් කාර් | JTMHV05J704113829 | 1VD 0211072 | මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ |
| CP KV- 9099 | පෝර්ච් පැනමෙරා මෝටර් කාර් | WP 0ZZZ9 7ZCL041168 | 105018 | ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 257 |
| CP LI-0689 | ටාටා එල්පීටී 2516 මෝටර් ලොරි | MAT396022A2R26459 | 01K62936179 | සෙංකඩගල ග්‍රාම නිලධාරි |
| CP LI-0446 | ටාටා එල්පීටී 2516 මෝටර් ලොරි | MA T396022A2R26090 | 01J62927948 | කොට්ඨාසයේ අංක 233, කොළඹ |
| CP LH-9974 | ටාටා එල්පීටී 2516 මෝටර් ලොරි | MAT396022A2R24368 | 01K-62937437 | පාර, මහනුවර දරන |
| CP LH-9973 | ටාටා එල්පීටී 2516 මෝටර් ලොරි | MAT396022A2R24173 | 01J62925927 | ස්ථානයේ |

**අංක 3477 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

| *ලියාපදිංචි අංකය* | *විස්තරය, නිෂ්පාදනය, මාදිලිය, අශ්වබල යනාදිය* | *චැසි අංකය* | *එන්ජින් අංකය* | *තබා ඇති ස්ථානය* |
|---|---|---|---|---|
| CP LK-7531 | එල්පීටී 709 මෝටර් ලොරි | MAT386542D8R03444 | 497TC93BWY805443 | මධ්‍යම පළාතේ මහනුවර |
| CP LK-5029 | එල්පීටී 709 මෝටර් ලොරි | MAT386542C8R38901 | 497TC93KXY857512 | දිස්ත්‍රික්කයේ ගඟවට |
| CP LK-5027 | එල්පීටී 709 මෝටර් ලොරි | MAT3 86542C8R38087 | 497TC93KXY856392 | කෝරළේ ප්‍රාදේශීය |
| CP LK-4875 | එල්පීටී 709 මෝටර් ලොරි | MAT386527C8R35493 | 497TC93JXY851755 | ලේකම් කොට්ඨාශයේ, |
| CP LK-5025 | එල්පීටී 709 මෝටර් ලොරි | MAT386542C8R38613 | 497TC93KXY857232 | අංක 257 සෙංකඩගල ග්‍රාම |
| CP PU-8413 | ටාටා 207 ඩීඅයි ද්විත්ව කාර්ය වාහනය | MAT374441C9R42817 | 497SP27KXY664938 | නිලධාරී කොට්ඨාසයේ අංක 233, |
| CP LK-5281 | ටාටා එල්පීටී 709 මෝටර් ලොරි | MAT386542C8R38073 | 497TC93JXY853379 | කොළඹ පාර, මහනුවර දරන ස්ථානයේ. |

ඉහත සඳහන් මෝටර් වාහන 2019 මැයි මස 28 වැනි දින පෙරවරු 10.00 ට එම මෝටර් වාහන තබා ඇති ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම ආරම්භ කරනු ලැබේ.

යෝජනා සම්මුති දැන්වීම .- *රජයේ ගැසට් පත්‍රයේ* 2019.03.01 වැනි දින පළ වී ඇති අතර, දිවයින, ද අයිලන්ඩ් සහ තිනකුරල් යන පුවත්පත්වල 2019.02.13 වැනි දින පළ වී ඇත.

ගෙවීමේ ක්‍රමය. - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,500, 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු යි.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. නීති අංශය, ඩී. එෆ්. සී. සී. බැන්ක් පීඑල්සී, අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02. දුරකතන අංක 011- 2371371.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකතන අංක : 011-3068185, 011- 2572940.

05-129

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

(1) ණය පහසුකම් යොමු අංක - 82355290 සහ 82355455
ස්ථිර අයිරා යොමු අංක - 76706073

දඹදෙනිය, කැලෑගෙදර, ලියනආරච්චිලාගේ ඉඳුනිල් බණ්ඩාර ලියනආරච්චි මහතාට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2018.12.28 දිනැති අංක 2104 දරන *ගැසට් පත්‍රයේ* හා 2018.12.13 වැනි දින ''ඩේලිනිවුස්'', ''දිනමිණ'' හා ''තිනකරන්'' යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේදී ම 2019.05.30 වැනි දින පෙ. ව. 11.00 ට 1 වැනි දේපළ ද, පෙ. ව. 11.30 ට 2 වැනි දේපළ ද, කොළොන්නාව, විහාර මාවත, අංක 50/3, ටී ඇන්ඩ් එච් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**පළමු උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පල හත්පත්තුවේ, නැගෙනහිර මැද පත්තු කෝරළේ, පන්නල ප්‍රාදේශීය සභා සීමාවේ පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1561, කවුඩුමුන්න ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කවුඩුමුන්න හා කන්නිමුල්ල ග්‍රාමයන්හි පිහිටි කදුරුගහවත්තෙන් කොටසක් කදුරුගොල්ල මීගහහේන, මාදංගහ කොටුවෙ පිල්ලෑවෙ වත්ත, කෝංගහමුලහේන සහ කදුරුගොල්ලවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඒ. එන්. ගුණසිරි විසින් සාදන ලද 2007.03.25 දිනැති අංක 5109 දරන

පිඹුරෙහි ලොට් 01 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1, උතුරට : සුබසිංහ අප්පුහාමිගේ ඉඩම ද, නැගෙනහිරට : සුබසිංහ අප්පුහාමිගේ ඉඩම ද, දකුණට : කවුඩුමුන්නේ සිට දඹදෙනියට ප්‍රධාන පාර ද, බස්නාහිරට: කේ. එම්. තිලකරත්නගෙ ඉඩම ද, මායිම්ව පර්චස් තිස්නවයයි දශම පහක (අ. 0, රූ. 0, පර්. 39.5) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සියලු දේ ද වේ. මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E96/84 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම පහත විස්තර කර ඇති ඉඩමෙහි නැවත මැනීමකි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පල හත්පත්තුවේ, නැගෙනහිර මැද පත්තු කෝරළේ, පන්නල ප්‍රාදේශීය සභා සීමාවේ පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1561, කවුඩුමුන්න ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කවුඩුමුන්න හා කන්නිමුල්ල ග්‍රාමයන්හි පිහිටි කදුරුගහවත්තෙන් කොටසක් කදුරුගොල්ල මීගහහේන, මාදංගහ කොටුවෙ පිල්ලෑවෙ වත්ත කෝංගහමුලහේන සහ කදුරුගොල්ලවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සී. කේ. තැන්නෙගෙදර විසින් සාදන ලද 1983.06.08 දිනැති අංක 321/83 දරන පිඹුරෙහි ලොට් 01 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1, උතුරට : අප්පුහාමිට අයිති ඉඩම ද, නැගෙනහිරට : අප්පුහාමිට අයිති ඉඩම ද, දකුණට : කටුගම්පල සිට දඹදෙනිය ප්‍රධාන පාර ද, බස්නාහිරට : කේ. එම්. තිලකරත්නගෙ ඉඩම ද මායිම්ව රූඩ් එකක (අ. 0, රූ. 1, පර්. 0) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පල හත්පත්තුවේ, නැගෙනහිර මැද පත්තු කෝරළේ, පන්නල ප්‍රාදේශීය සභා සීමාවේ පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1561, කවුඩුමුන්න ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කවුඩුමුන්න හා කන්නිමුල්ල ග්‍රාමයන්හි පිහිටි කදුරුගහවත්තෙන් කොටසක් කදුරුගොල්ල මීගහහේන, මාදංගහ කොටුවෙ පිල්ලෑවෙ වත්ත කෝංගහමුලහේන සහ කදුරුගොල්ලවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඒ. එන්. ගුණසිරි විසින් සාදන ලද 2007.03.25 දිනැති අංක 5109 දරන පිඹුරෙහි ලොට් 02 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2, උතුරට : කඩුමුන්නේ සිට දඹදෙනියට ප්‍රධාන පාර ද, නැගෙනහිරට : කේ. එම්. තිලකරත්න හා වෙනත් අයට අයිති කුඹුර, පාසලට වෙන් කරන ලද ඉඩම හා කේ. එම්. කරුණාතිලකගේ ඉඩම ද, දකුණට : කේ. එම්. කරුණාතිලකගේ ඉඩම ද, බස්නාහිරට : පාර (ප්‍රා. ස.) ද මායිම්ව අක්කර තුනයි රූඩ් තුනයි පර්චස් තිස්දෙකයි දශම දෙකක (අ. 3, රූ. 3, පර්. 32.2) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති වෙනත් සියලු දේ ද වේ. මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L225/226 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඊ. එම්. එච්. බී. එදිරිසිංහ,
කළමනාකරු.

ලංකා බැංකුව,
ගිරිඋල්ල.

05-328

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.